
# “බජරී” ආදර කුරුල්ලා

පුනයා චාන්දනි ද සිල්වා



**තාක්ෂණය කෙතරම් දියුණු වුණත් පරිසරයෙන් මිදී ජීවත්වීමට අපට නොහැකි බව ඔබ හොඳින් දන්නවා ඇති. කොන්ක්‍රීට් බිත්ති සතරක මැද සිර වුන ඔබගේ පුංචි ඉඩක හෝ Lore Birds ලෙසින් හඳුන්වන සුරතල් කුරුල්ලා ගේ අතෝරක් නැති කන් කරච්චලය ඇසුනද එය ඔබට කන්කළු නාදයක් වනු ඇත.**

ශ්‍රී ලංකාව තුළද Lore Birds ලෙස ප්‍රකට මෙම කුරුල්ලන් බජ-රියා Budgeriger ලෙස හඳුන්-වන ඔස්ට්‍රේලියානු ගිරව් විශේෂ-යකි. බොහෝ රටවල මෙම කුරුලු සුරතලුන් දූන් ඉතාම ජනප්‍රියව ඇත. විශේෂඥයින් සඳහන් කරන අන්දමට ඔස්ට්‍රේලියාවේ නිවාස දහයකින් එකක්වත් මෙම කුරුලු විශේෂයන් දක්නට ලැබේ. ඇමරි-කාවේ මෙම ගිරා විශේෂය බටු ගිරවු(Parakeets)යන නමින් හඳුන්වනු ලබයි.

ලෝකයේ ගිරා විශේෂ 330 ක් අතර ඉතාම කුඩා වර්ගය වන මෙම බජරියා කුරුල්ලන් Melopsittacas Urdulatus පරම්පරාවෙන් පැවතෙන්නේය. ඔස්ට්‍රේලියාව නිජබිම කර ගෙන පැවැතෙන බජරියන් පිළිබඳව ඉංග්‍රීසි ජාතික පරිසරවේදියකු වූ “ජෝන් ගෝල්ඩ්” මෙසේ සඳහන් කරයි. සිය අධ්‍යනය සඳහා ජෝන් ක්ෂෙත්‍ර අධ්‍යනයන් රැසක් සිදු කරන ලදී. සිය අත්දැකීම් ආශ්‍රය කර ගෙන බජරියන් පිළිබඳව ඔහු මෙසේ සඳහන් කරයි.

නිදහසේ හැසිරෙන මෙම කුරුල්ලන් ඉතා අලංකාරය ප්‍රේමාන්විත හැසිරීමක නිරතවන අතර සුළු සුළු දබර නැතුවාම නොවේ. අහංකාර ගති පැවැතුම් ඇති මෙම ඕනෑම වර්ගයක බජරි-යන්ට සුන්දර පිහිටීමක් ඇත. ඔවුන් පිළිබඳව මා සිතුවාටත් වඩා බොහෝ සේ සිත අලවන ආකර්ශ-නයන් මා තුළ ඇති වුනා යැයි ජෝන් ගෝල්ඩ් සටහන් තබන ලද්දේ ක්‍රි.ව.1840 දිය.

ඔහු මේ සටහන තබා දූන් අවු-රුදු එකසිය පනහක් පමන ඉක්ම ගොස් ඇත. එහෙත් බජරි කුරුල්-ලන්ගේ සුරතල් ගැන කථා බහ දින දිනම අලූත් වෙමින් පවති. දිග වලිගයක් ඇති මේ කුරුල්ලන් ගෝලාකාර හැඩැතිය. හිස සිට වලිගය දක්වාම දිග සෙ.මී.30 ක් පමණය. නළල බූව (Fluffy) සහිතය. විවිධාකාර වර්න සහිත මෙම කුරුල්ලන් නිල් අලූ සුදු කොල ආදි සිත් ඇදගන්නා වර්-ණාවලියක ආලෝකය ලබා ඇත. ඉතාම බිය සුළු බජරි කුරුල්ලන් අතර බිත්තර කහ මද පැහැති කුරුළු වර්ගය Lutinasනමින් හඳුන්වනු ලබයි.

බොහෝ දෙනෙකු මෙම බජරි කුරුල්ලන්ගේ වර්ගයට දැඩි සේ ඇළුම් කරති. “වොරිනර් විල්සන්” 43 හැවිරිදි පශු වෛද්‍ය විශේෂ-ඥයෙකි. බජරි කුරුල්ලන්ගේ වර්ග විපර්යාසය පිළිබඳ ඔහු දක්-වන්නේ දැඩි උනන්දුවකි. වෝර්නප් ගේ මවද මෙම කුඩා කුරුල්ලන්ට ඉතා දැඩි සේ ආදරය කළාය. ඇගේ උඩුකය මත නිතරම බජරි කුරුල්-ලලෙක් රඳවා ගෙන සිටීම සිරි-තක්ව තිබුනි.

මේ ආභාෂය නිසාමදෝ වෝර්-නර් තුළද කුරුල්ලන් පිළිබඳව දැඩි කුතුහලයක් වූ අතර බජරියන් ආශ්‍රය කරගත් පර්යේෂන සඳහා ඔහුගේ අවධානය ඉබේටම යොමු විය.

වෝර්නර් දිනක් මා කැඳවා ගෙන ගියේ ඔහුගේ බජරි කුරුළු නිවාසයටය. එහි කහ,නිල්.සුදු වර්ගයේ බජරියන් පනහක් පමන වූහ.

සිය වර්නවත් පියාපත් විදහා මේ කුරුලූ රැන මා වට කරන්ම කලබල වෙන්න එපා යැයි ඔහු දරුවන් සේ මෙම කුරුල්ලන් හිලෑ කලේය.විල්සන් මා සමග නව දුරක් ගියේය. ලනු පැදුරක් එසවූ විට ලී කූඩු වලට යටට තිබුන සුදු පාට කුරුලූ බිත්තර හතකි. ඒවා නියපොතු තරම් විය. මේ අතරට නවත් කුරුළු පැටවුන් කීප දෙනෙකි. ඔවුන් තවම ඇස් හැර නැත.

“මේ ගොල්ලන්ට තවම දවස් දෙකයි. සුමානයක් විතර ගියාම ඇස් අරිවි. මේ කුරුල්ලන් ආහාර ගබඩා කර ගෙන ඉන්නේ “

මේ කුරුලූ පැටියගෙ මව් පිය පරම්පරාව තහවුරු කරන්න පුළු-වන්. අලූ සුදූ පියාපත් වලින් සහ කහ පාට මුහුණෙන් වෙන් කරපු පෙට්ටියෙ ඉන්නෙ කුරුලූ අම්මා. ඔහු ඉතා සෙමෙන් ඒන් දැඩි ග්‍රහන-යෙන් කුරුලූ මව අල්ලා ගත්තේය.

කුරුල්ලන් ඇතිකරන උදවිය සඳහන් කරන්නේ මෙම මුල් බජ-රියන් සමග කැලෑ බජරියන්ගේ ප්‍රජනන කටයුතු පිළිබඳව ගවේෂ-නාත්මක අධ්‍යයන යෙදුන බ්‍රිතාන්‍ය

ජාතික ලැම්නට්ස් හෙලන් සඳහන් කරයි.

මේ පිරිස බජරියන් පිළිබඳව ගවේෂනය කලේ ඔවුන්ගේ ප්‍රජනනය සිදුවන කාල සීමාවකය. මේ කාලයේ දී කැලෑ බජරියන් යූකැලිපටිස් ගස්වල කූඩු තනා ඇති බවත් එය බොහෝ කාලයකට පසුව සිදුවන දෙයක් බවත් ග්‍රෙග් ටේලර් නම් වාහන ගනු දෙනු කරුවෙක් සඳහන් කරන ලදී.

මේ අතර හෙක්ටයාර් 1300 ක පමන දුර විහිදුන ඇලිස් ස්ප්‍රින්ස් ඩෙසර් වන ජීවී රක්ෂනයේ කුරුළු ආරක්ෂක අංශයේ බෲස් පැස්කෝද කැලෑ බජරියන් පිළිබඳ තොරතුරු සෙවීම සඳහා උදව් විය.

මෙම කැලෑ බජරියන් වතුර නැති කාලවලදී දිය අසල රැඳී සිටියද වැසි වැටෙත්ම එම ස්ථාන වලින් පිටව යන බව බෲස් සිය අත්දැකීම් අනුව හඳුනාගනෙ ඇත.

මේ අතර රක්ෂිත වනයේ සංරක්ෂක (සත්ව විද්‍යා) ග්‍රේ ෂයි විසින් අපගේ ගවේෂනය ඉදිරියට ගෙන යැම සඳහා වාහනයක්ද ලබා දුන්නේය. මොඩ් ගංගාව දිගටම වූ යූකැලිපටස් ගස්වල වෙනදට නම් කැලෑ බජරියන් ඉන්නවා රියදුරු කීවේය. වාහන ජනෙල් හැර බජරියන් පිළිබඳව අවධානයෙන් සිටියදී ගස් අතු පතර ඔවුන්ගේ කුරුලු ගී නද ඇසෙන්නට විය. විනාඩි විස්සක් පමණ ගෙවුන විට වැස්සක පෙර නිමිති පහළ වූයෙන් එදින ගවේෂනයේ කටයුතු නිමාවිය.



බජරී කුරුල්ලන්ට කථා බහ හුරු කිරීමට අවශ්‍ය නම් ඔවුන්ට සති හයක් වු විට කථා බහ ආරම්භ කරන්න. කුඩුව තුළ ඇති අනවශ්‍ය දේ ඉවත්කොට කථා බහ ආරම්භ කරන්න. රාත්‍රී කාලයේ දි කථා බහ තුළින් කුරුල්ලන් වචන ග්‍රහනය කර ගැනීම ඉක්මන් වනු ඇත.



කූඩු කරන ලද බජරියන්ට කාමරයකවත් එහා මෙහා පියඹා යන්නට නොහැකි වුනත් කැලෑ බජරියන්ට පැයට කිලෝ මීටරයක පමණ වේගයෙන් කිලෝ මීටර් සියයක දුර පියඹා යැමේ ශක්තිය ඇත. මෙම කුරුල්ලන් (කැලෑ බජරියන්) ආහාර සහ ජලය සොයා ගෙන බොහෝ දුර පියඹා යා හැකි අතර විජලනයට ඔරොත්තු දීමේ ශක්තියද ඇත. එහෙත් වතුර හිඟවන විට මෙම කුරුල්ලන්ගේ බර අඩු වන්නට පටන් ගනී. වාතයේ තෙතමනය හිඟවන විට ආහාර මගින් අවශ්‍ය ජලය ලබා ගනු ඇත. ඔබ බජරියන් ඇති කරන්නේ නම් මේ ගැන සිතන්න.

ඔබ බජරි කුරුල්ලන් මිළට ගැනීමේ දී වගකිව යුතු අන්දමේ කුරුළු ප්‍රජනන මධ්‍යස්ථානයෙන් කුරුල්ලෙකු මිලට ගන්න.

මෙම කුරුල්ලන් තිරස් අතට පියාඹන (Hori Zonatally)පක්ෂි විශේෂයන් නිසා කූඩුව දිග අතට තිබීම වැදගත්ය.

පිරිසිදු ජලය සහ ඇට වර්ග ලබා දෙන්න. බජරි කුරුල්ලන්ට ලුනු අවශ්‍ය බැවින් මාසි දැල්ලන් පොත්ත නොසෝද දෙන්න. මේවායේ කැල්සියම්ද අන්තර්ගතව ඇති බැවින් බජරියන්ට හොඳ පෝෂ්‍ය මූලාශ්‍රයක් වනු ඇත. සෝද පිරිසිදු කග අල, තණකොල, නිවිති ආදියද බජරියන්ගේ ආහාර ලෙස යොද ගත යුතුය.

බජරි කුරුල්ලන්ගේ කූඩු වල ක්‍රීඩා උපකරණ සවි කිරීමෙන්ද ඔවුන්ගේ ක්‍රියාශීලීත්වය වර්ධනය වේ. මිහිරි නාද නැගෙන සීනු කන්නාඩි දම්වැල් ආදිය බජරියන්ට ගැලපෙන ක්‍රීඩා උදපකරණ ලෙස නම් කළ හැක.

ඔබට පැටවුන් ලබා ගැනීමට අවශ්‍ය නම් බජරි කුරුලු යුවලට සිය ප්‍රජනන කටයුතු සඳහා පාර්ශවයත් ලබා දෙන්න. එම කූඩුව ලී කූඩු හෝ දහයියා වැනි ද්‍රව්‍ය වලින් සකසා බජරි ප්‍රජනනයට අවශ්‍ය පහසුකම් ලබා දිය යුතුය.

බජරි කුරුල්ලන්ට කථා බහ හුරු කිරීමට අවශ්‍ය නම් ඔවුන්ට සති හයක් වූ විට කථා බහ ආරම්භ කරන්න. කූඩුව තුළ ඇති අනවශ්‍ය දේ ඉවත්කොට කථා බහ ආරම්භ කරන්න. රාත්‍රී කාලයේ දි කථා බහ තුළින් කුරුල්ලන් වචන ග්‍රහනය කර ගැනීම ඉක්මන් වනු ඇත. එක් වතාවක ඔවුන් ඉගෙන ගන්නේ වචනයක් දෙකක් පමණි. කථා බහ පුරුදු කිරීමේ දි එක් කටහඬක් යොද ගන්න. සරල වචනයක් තෝරා ගන්න. Helli Nice Girlවැනි වචන නැවි ගත කොට කූඩුව අසල ප්‍රතිවාදනය කරන්න. දින කීපයක් ගත වන විට බජරි කුරුල්ලන් ඔබටද එසේ ආමන්ත්‍රනය කරනු ඇත.

❑

රීඩර්ස් ඩයිජස්ට් ඇසුරිනි